# NEWS IN BRIEF

**Department of Census and Statistics - Sri Lanka**

ජන හා නිවාස සංගණනය 2011 ප්‍රශ්නාවලිය පිළිබඳ දත්ත භාවිතා කරන්නන්ගේ
අදහස් විමසීමේ රැස්වීම 2010.03.23

---

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2011 වසරේදී පැවැත්වීමට සැලසුම් කර ඇති ජන හා නිවාස සංගණනය පිළිබඳව හා සංගණන දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීමේ මෙන්ම ප්‍රශ්නාවලිය පිළිබඳ ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වැඩ මුළුවක් විද්වතුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් 2010 මාර්තු මස 23 වන දින සව්සිරිපාය ශ්‍රවනාගාරයේදී පවත්වනු ලැබීය. මෙම වැඩ මුළුවේ ප්‍රධාන අමුත්තා ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් උදය සෙනවිරත්න මහතා සහභාගි විය. මෙම සංගණනය 1981 සංගණනයෙන් පසු උතුරු හා නැගෙනහිර පළාත්ද ආවරණය වන පරිදි පැවත්වෙන මුල්ම සංගණනය වනු ඇත.

සංගණනයකින් රැස්කරන තොරතුරු මූලික වශයෙන් රටක ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනයේදී ප්‍රධාන මූලාශ්‍රයක් වන අතර, ඊට අමතරව ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන අවශ්‍යතා, විවිධ පර්යේෂණ විශ්ලේෂණ හා සහස්‍ර සංවර්ධන අභිමථාර්ථ වැනි සංවර්ධනය මනින ජාත්‍යන්තර සම්මුතීන් සඳහාද යොදා ගනු ලැබේ. එමනිසා මේ සඳහා උපයෝගී කරගන්නා ප්‍රශ්නාවලිය පිළිබඳ දත්ත භාවිතා කරන්නන්ගේ අදහස් හා යෝජනා සලකා බැලීම ඉතා වැදගත් වේ.

වැඩ මුළුවේ කටයුතු ආරම්භ කරමින් අධ්‍යක්ෂ ජනරාල් තුමිය විසින් සංගණනය සැලසුම් කර ඇති ආකාරය පැහැදිළි කළ අතර අධ්‍යක්ෂ එච්. ආර්. ගුණසේකර මහතා විසින් සංගණන ක්‍රමවේදය හා යෝජිත වැඩිදියුණු කිරීම් පිළිබඳ පැමිණ සිටි විද්වත් පිරිස දැනුවත් කරන ලදී. සංගණන අංශයේ නිලධාරීන් ප්‍රශ්නාවලියේ අඩංගු ප්‍රශ්න පිළිබඳව පැහැදිලි කරන ලද අතර වැඩ මුළුවට සහභාගි වූ විද්වතුන් ප්‍රශ්නාවලිය පිළිබඳ විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදී. තවද එම යෝජනා තවදුරටත් සාකච්ඡාවට භාජනය කිරීමෙන් අනතුරුව යම් යම් තීරණ වලට එළඹීමට එමගින් අවස්ථාව ලැබිණ.







